// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1789/41 - 2012 දෙසැම්බර් මස 21 වැනි සිකුරාදා - 2012.12.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත

4(2) උපවගන්තිය යටතේ කරනු ලබන පළකිරීම්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (මෙහි මින් මතු 'ආයතනය' යනුවෙන් සඳහන් කරනු ලබන) වෙත පැවරී ඇති බලතල අනුව, ආයතනය විසින් මේ සමග පළකර ඇති පොදු පාලන සංයෝජන සඳහා සම්බන්ධන ගිණුම්කරණය පිළිබඳ නිර්දේශිත පරිචය ප්‍රකාශනය, සම්මත කර ඇති අතර, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනතේ අරමුණු සඳහා මෙම ප්‍රමිතීන් වර්ෂ දෙදහස් දහතුනේ ජනවාරි මස පළමුවැනි දින හෝ ඊට පසුව ආරම්භ වන කාලපරිච්ඡේද ආවරණය කෙරෙන මූල්‍ය ප්‍රකාශන සඳහා බලාත්මක වේ.

ආයතනයේ පාලක සභාවේ අණ පරිදි,

අරුණ අල්විස්,
ලේකම්.

2012 දෙසැම්බර් මස 21 වැනි දින,
කොළඹ 07,
මලලසේකර මාවත,
අංක 30ඒ,
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ දී ය.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඇමුණුම්

**නිර්දේශිත පරිචය ප්‍රකාශනය**

***පොදු පාලන සංයෝජන සඳහා සම්බන්ධන ගිණුම්කරණය***

පොදු පාලන සංයෝජන සඳහා සම්බන්ධනය ගිණුම්කරණය පිළිබඳ නිර්දේශිත පරිචය ප්‍රකාශනය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ පාලක මණ්ඩලය විසින් 2012 දෙසැම්බර් මස 19 වැනි දින අනුමත කරන ලදී.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ කර්තෘ හිමිකම් අඩංගු දෑ මෙම ගිණුම්කරණ මගපෙන්වීමේ අන්තර්ගත වේ. ප්‍රභවය අඩංගු කිරීම පිළිගැනීමට යටත්ව පෞද්ගලික සහ වාණිජමය නොවූ කටයුතු සඳහා වෙනස් නොකළ ස්වරූපයක් නැවත ප්‍රත්‍යුත්පාදනයට අවසර ඇත. වාණිජ අරමුණු සඳහා නැවත ප්‍රත්‍යුත්පාදනයට ඉල්ලීම් සහ විමසීම් අරුණ අල්විස් මහතා, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය, 30 A, මලලසේකර මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව යන ලිපිනයට යොමු කළ යුතු ය.

***පොදු පාලක සංයෝජන සඳහා සම්බන්ධන ගිණුම්කරණය***

*පටුන*


| | ඡේදයන් |
|---|---|
| හඳුන්වාදීම | 1-4 |
| මූලධර්ම | 5-8 |
| ක්‍රියාපිළිවෙත් | 9-12 |
| අලුතින් ඇතිකරන ලද පරිපාලකයක් විසින් ආවරණය කරන ගිණුම් කාලපරිච්ඡේදය | 13-14 |
| අදාල SLFRSs /LKASs මගින් වන අවශ්‍යතාවයන්ට අමතර වූ හෙළිදරව් කිරීම් | 15-17 |
| කොටසක ඉපයුම් | 18 |
| බලපවත්වන දිනය | 19 |
| පරිශිෂ්ටය 1 -සංඛ්‍යාත්ම උදාහරණ | |
| පරිශිෂ්ටය 2 - මෙම නිපප්‍රය ව්‍යාවහාර කළ හැකි අවස්ථාවන්වලට උදාහරණ | |


මෙම නිර්දේශිත පරිචය පිළිබඳ ප්‍රකාශනය සඳහා විධිවිධාන අනිවාර්ය නොවුන ද ඒවායේ විෂයය පථය තුළට වැටෙන අස්තිත්ව මෙම නිපප්‍රය මගින් නියම කර ඇති නිර්දේශ අනුකූල වීමට උනන්දු කරනු ලැබේ.

*නිර්දේශිත පරිචය පිළිබඳ ප්‍රකාශනය*

**හැඳින්වීම :**

1. පොදු පාලන සංයෝජනයන් හඳුනා ගැනීමේ දී සම්බන්ධන ගිණුම්කරණයෙහි මූලික මූලධර්ම සහ ක්‍රියාපිළිවෙත් නියම කිරීම මෙම SoRP මගින් දක්වා ඇත. මෙම SoRP සහ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත හෝ අර්ථකථන (සාමුහිකව ගත් කල "SLFRS/ LKAS", ලෙස යොමු කරන) අතර කිසියම් නොගැලපීමක් තිබේ නම්, එම ප්‍රමිතය හෝ අර්ථකථනය අනුගමනය කළ යුතු වේ. සම්බන්ධන ගිණුම්කරණය යොදාගනිමින් පොදු පාලන සංයෝජන සඳහා ගිණුම් තැබීමට අදාල මගපෙන්වීම් සහ නියමයන් සමහර SLFRSs/LKASs වල අඩංගු විය හැකිවේ. උදාහරණ ලෙස සමාන ගණු දෙනු සඳහා සංගත පදනමක් මත ගිණුම් ප්‍රතිපත්ති යොදා ගත යුතු බව LKAS 8 ගිණුම් ප්‍රතිපත්ති, ගිණුම් ඇස්තමේන්තු වෙනස්වීම් සහ වැරදි මගින් නියම කරයි. ඒකාබද්ධ මූලධර්මයන් සහ පරිපාලිත බැහැර කිරීමේ දී සැලකිය යුතු ආකාරය LKAS 27 ඒකාබද්ධ සහ වෙන් වූ මූල්‍ය ප්‍රකාශන යොමුකරන අතර ප්‍රතිව්‍යුහකරණය සඳහා විධිවිධාන LKAS 37 ප්‍රතිපාදන අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම් යොමුකර ඒ අනුව අස්තිත්වයක් සම්බන්ධන ගිණුම්කරණය ව්‍යවහාරකරනය විට එම මගපෙන්වීම හෝ ඒ අවශ්‍යතාවයන් මෙම SoRP හි දක්වා ඇති මගපෙන්වීම වෙනුවට හෝ එයට අමතර ලෙස අදාළ කර ගත යුතු ය.

2. සංයෝජනය විශේෂිත ලෙස එහි විෂයපථයෙන් බැහැර කොට ඇති විට හැර සියලුම ව්‍යාපාර සංයෝජනය කිරීම්වලට 2012 ජනවාරි මස 01 හෝ ඉන් පසුව ආරම්භවන ගිණුම් කාලපරිච්ඡේද සඳහා SLFRS 3 ව්‍යාපාර සංයෝජන අදාල වේ. උදාහරණ ලෙස SLFRS 3 හි විෂයයපථයෙන් බාහිර ව්‍යාපාර සංයෝජනය කිරීම්, පොදු පාලනය යටතේ පවතින ව්‍යාපාර

හෝ අස්තිත්ව සම්බන්ධ වන ව්‍යාපාර සංයෝජන සඳහා උචිත ගිණුම්කරණ පිළිපැදීම් අමතන විශේෂිත ගිණුම්කරණ ප්‍රමිතයක් නොමැත.

3. SLFRS 3 ව්‍යවහාර කරන උපදේශන (අ 1 ඡේද) අනුව අස්තිත්ව හෝ පොදු පාලන යටතේ ඇති ව්‍යාපාර සම්බන්ධ කරගන්නා ව්‍යාපාර සංයෝජනය "සියලුම සංයෝජනය වන අස්තිත්වයන් හෝ ව්‍යාපාර එකම පාර්ශ්වය විසින් හෝ ව්‍යාපාර පාර්ශ්වයට පෙර හෝ පසු සිටි පාර්ශ්වය යන දෙකම විසින් අවසාන වශයෙන් පාලනය කරන ව්‍යාපාර සංයෝජනයන් ලෙස සහ එම පාලනය අස්ථිර නොවන ලෙසද" නිර්වචනය කෙරේ. ඒවා SLFRS 3 හි විෂය පථය තුල හෝ ඉන් පිටත වැටෙන වෙනත් ව්‍යාපාර සංයෝජන වලින් වෙන්කොට හඳුනාගත හැකිවීමට එවැනි ව්‍යාපාර සංයෝජන මෙතැන් සිට මෙම SoRP හි "පොදු පාලන සංයෝජනයන්" ලෙස යොමු කෙරේ.

4. මතභේදයකට පාදකවන කරුණකට විශේෂිත ව්‍යවහාරවන ප්‍රමිතයක් හෝ අර්ථකථනයක් නොමැති විටක LKAS 8 ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්වීම් සහ වැරදි ප්‍රමිතියෙහි 10-12 ඡේද, ගිණුම්කරණ ප්‍රතිපත්තීන් තෝරා ගැනීම සඳහා වන අවශ්‍යතාවයන් අන්තර්ගත වේ. පොදු පාලන සංයෝජන SLFRS 3 හි විෂයයපථය පිටතින් වැටේ. ඒ අනුව අස්තිත්වයක් LKAS 8 හි දක්වා ඇති අවශ්‍යතාවන්ට අනුව යෝග්‍ය ගිණුම් ප්‍රතිපත්තිය තෝරා ගන්නා අතර බොහෝ අස්තිත්ව පොදු පාලන සංයෝජන සඳහා යෝග්‍ය ගිණුම් ප්‍රතිපත්තියක් ලෙස සම්බන්ධන ගිණුම්කරණය සලකනු ලබයි.

මූල ධර්මයන් :

5. ව්‍යාපාර සංයෝජන සඳහා ගිණුම් තැබීමට සම්බන්ධන ගිණුම්කරණය යොදාගැනීම පාදක වන සංකල්පය නම් අත්පත්කර ගැනීමක් සිදු වී නොමැති බව සහ ව්‍යාපාර සංයෝජනය කිරීමට පෙර පැවති පාලනය කරන පාර්ශ්වයට (හෝ පාර්ශ්වයන්) අවදානම් සහ ප්‍රතිලාභ අඛණ්ඩව ලැබීමයි. මෙම අස්තිත්ව හෝ ව්‍යාපාර සංයෝජන සඳහා සම්බන්ධන ගිණුම් තැබීම භාවිතයෙන් කලින් මෙන් වෙන් වූ අස්තිත්ව හෝ ව්‍යාපාර ලෙස අඛණ්ඩවීම සම්බන්ධන ගිණුම් තැබීම යොදා ගැනීම මගින් හඳුනා ගැනේ.

6. සම්බන්ධිත ගිණුම්කරණය ව්‍යවහාරකරනයේදී පොදු සංයෝජනය සිදු වූ වාර්තා කරන කලපරිච්ඡේදය සඳහා සංයෝජිත අය අස්තිත්වයන් හි මූල්‍ය ප්‍රකාශන අයිතමයන් හෝ ව්‍යාපාරවල සහ හෙළිදරව් කරන යම් කාලපරිච්ඡේදයක් සඳහා සංයෝජිත අස්තිත්වයේ හෝ ව්‍යාපාර පාලනය කරන පාර්ශ්වය හෝ පාර්ශ්වයන්ගේ පාලනයට පත් වූ ප්‍රථම දිනයේ සිට සංයෝජනය සිදුවූවා යැයි සලකා සංයෝජිත අස්තිත්වයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් වේ.

7. තුන්වන පාර්ශ්වයකින් කලින් අත්පත් කරගත් අස්තිත්වයක් හෝ ව්‍යාපාරයක් සංයෝජනය වන අස්තිත්වයන් හෝ ව්‍යාපාරවල ඇතුලත් වනවිට එවැනි අස්තිත්වයේ හෝ ව්‍යාපාරයේ මූල්‍ය ප්‍රකාශන අයිතම සංයෝජිත අස්තිත්වයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කරනුයේ කලින් අත්පත් කරගත් දින සිට, එදින හඳුනාගත් අත්පත් කරගැනීමේ වටිනාකම් භාවිතා කිරීමෙන් පමණි.

8. සංයෝජිත අස්තිත්ව විසින් තනි ඒකාකාර ගිණුම්කරණ ප්‍රතිපත්තීන් කට්ටලයක් තෝරාගනු ලබයි. එනිසා පොදු පාලන සංයෝජනයට පෙර පාලනය කරන පාර්ශ්වය හෝ පාර්ශ්වයන් හි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල සංයෝජනය වන අස්තිත්ව හෝ ව්‍යාපාරයන් හි වත්කම් වගකීම් සහ ස්කන්ධයෙහි ධාරණ වටිනාකම් සංයෝජිත අස්තිත්වය හඳුනාගනී. පාලනය කරන පාර්ශ්වය හෝ පාර්ශ්වයන් විසින් කලින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට නොමැතිනම්, සංයෝජනය වූ අස්තිත්වයේ ගිණුම් ප්‍රතිපත්ති සහ එම ප්‍රතිපත්තීන් ඉදිරිපත් කර ඇති සියලු කාලච්ඡේදවලට අදාල කර ගනිමින් එම ප්‍රතිපත්ති වලට අනුගත වීම සඳහා අවශ්‍ය වූ ගැලපීම් කිරීමෙන් පිළියෙල කරන ලද්දේ යැයි සලකා ධාරණ වටිනාකම් ඇතුලත් කරයි. මෙම ධාරණ වටිනාකම් පාලනය කරන පාර්ශවයේ යථා දර්ශනය තුළින් පවත්නා පොත් වටිනාකම ලෙස පහත සඳහන් කරනු ලබයි. පොදු පාලන සංයෝජන අවස්ථාවේ දී අත්පත් කර ගැනීමට භාජනයවන්නාගේ හඳුනාගත හැකි වත්කම්, වගකීම් සහ අසම්භාව්‍ය බැරකම් වල පිරිවැය ඉක්මවන ශුද්ධ සාධාරණ වටිනාකම, පාලන පාර්ශ්වය හෝ පාර්ශ්වයන්ගේ පැවතෙන හිමිකමේ ප්‍රමාණයට කිසිම අතිරේක කීර්තිනාමයක් හෝ අතිරික්තයක් අත්පත්කරගන්නාගේ හිමිකමෙහි හඳුනා නොගනී. එලෙසම LKAS 27 ප්‍රකාර සංයෝජනය වන අස්තිත්වයන් හෝ ව්‍යාපාරයන් අතර වූ සියලු ගනුදෙනුවල බලපෑම සංයෝජිත අස්තිත්වයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කිරීමේ දී ඉවත් කළ යුතු ය.

ක්‍රියා පටිපාටිය :

9. ඒකාබද්ධ ගිණුම්කරණයේ ප්‍රායෝගික බලපෑම් වනුයේ :

(අ) පාලනය කරන පාර්ශ්වයේ යථා දර්ශණය පැත්තෙන් ගත් කල දැනට පවතින පොත් වටිනාකම් භාවිතා කරමින් සංයෝජනය වන අස්තිත්වයන්ගේ හෝ ව්‍යාපාරයන්ගේ ශුද්ධ වත්කම් ඒකාබද්ධ කරයි. (8 වන ඡේදය බලන්න). පාලනය කරන පාර්ශ්වයේ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වන පරිදි අත්පත් කරගත් අස්තිත්වයේ හෝ ව්‍යාපාරයේ වත්කම්

සහ වගකීම් පොත් අගයට සටහන් කළ යුතු ය. (එනම්, පාලනය කරන පාර්ශ්වය විසින් තුන්වන පාර්ශ්වයකින් අත්පත් කරගත් අස්තිත්වයේ හෝ ව්‍යාපාරයේ හඳුනාගත් වත්කම් සහ වගකීම් මුල් අත්පත් කරගත් දින ඒවායේ සාධාරණ අගයට වාර්තා කිරීම අවශ්‍ය වනු ඇත. කලින් අත්පත් කර ගැනීමේදී පැන නැගුන ඉතිරි වූ යම් කීර්තිනාමය සහ සුළු කොටස් හිමියන්ගේ අයිතිය පාලනය කරන පාර්ශ්වයේ ඒකාබද්ධ මුල්‍ය ප්‍රකාශවල සටහන් කළ යුතුවේ). පාලනය කරන පාර්ශ්වය මුල්‍ය ප්‍රකාශන පිළියෙල නොකරන කල්හි එවැනි ඒකාබද්ධ මුල්‍ය ප්‍රකාශන පිළිවෙල කර තිබූ ලෙස සලකා අත්පත්කර ගත් ආයතනයේ ධාරන වටිනාකම් ඇතුලත් කරයි.

(ආ) කීර්තිනාමය සඳහා ප්‍රතිශ්ඨාවක් ලෙස හෝ පොදු පාලන සංයෝජන අවස්ථාවේ පිරිවැයට වැඩියෙන් පවත්නා අත්පත් කර ගැනීමට භාජනය වන්නාගේ හඳුනාගත හැකි වත්කම් බැරකම් සහ අසම්භාව්‍ය බැරකම්වල ශුද්ධ සාධාරණ වටිනාකම කෙරෙහි අත්පත්කරගන්නාගේ හිමිකමින් අතිරික්තය හෝ පාලන පාර්ශවය හෝ පාර්ශවයන්ගේ අයිතිය පවත්වාගෙන යන තෙක් කිසිදු වටිනාකමක් හඳුනාගනු නොලැබේ.

(ඇ) සංයෝජනයවන අස්තිත්ව හෝ ව්‍යාපාර මුලින්ම පොදු පාලනය යටතට පැමිණියේ පසු දිනක නොවේ නම් හැර, අස්තිත්ව හෝ ව්‍යාපාර කලින් ශේෂපත්‍ර දින සංයෝජනය වූවායි සලකා ඉහත 9 (අ) ඡේදයේ නියමකර ඇති මූලධර්ම භාවිතාකර මුල්‍ය ප්‍රකාශනවල සංසන්දනාත්මක වටිනාකම් ඉදිරිපත් කෙරේ.

10 ඉදිරිපත් කළ කලින්ම දින සිට (සංසන්දනාත්මක කාලපරිච්ඡේද ඇතුළත්ව) හෝ පාලනය කරනු ලබන පාර්ශවය හෝ පාර්ශවයන්ගේ පාලනය යටතට ගැණුන පළමු දින සිට මෙය කෙටි කාලපරිච්ඡේදයක් වන විට පොදු පාලන දිනය නොසලකා ව්‍යාපාරවල හෝ සංයෝජනය වන සෑම අස්තිත්වයන්ගේ ප්‍රතිඵල ඒකාබද්ධ ආදායම් ප්‍රකාශනයේ ඇතුළත් වේ. පාලනය කරන පාර්ශවයේ ඒකාබද්ධ මුල්‍ය ප්‍රකාශනවල වාර්තා වී ඇති සුළු කොටස් හිමියන්ගේ අයිතියට ආරෝපනය වන ලාභ හෝ අලාභද ඒකාබද්ධ ආදායම් ප්‍රකාශනයේ ගණන් ගනී.

11. ඒකාබද්ධ ගිණුම් තැබීම භාවිතා කර ගිණුම් තබන විට දී පොදු පාලන සංයෝජනයකට සම්බන්ධව දරන ලද වියදම්, එම වියදම දරන ලැබු කාලපරිච්ඡේදයේ වියදමක් ලෙස හඳුනාගනී. පොදු පාලන සංයෝජනය ඉෂ්ට කරගැනීමේදී ඇතුළත් වන වියදම්වලට වෘත්තීය ගාස්තු, ලියාපදිංචි ගාස්තු, කොටස් හිමියන්ට තොරතුරු සැපයීමේ පිරිවැය, සහ වැටුප් සහ අනෙකුත් වියදම් ඇතුළත් වේ. කලින් වෙන්ව තිබූ ව්‍යාපාරයන්හි මෙහෙයුම් සංයෝජනයේ දී දරන ලද කිසියම් පිරිවැය හෝ අලාභ ද එයට ඇතුළත් වේ.

12. ඒකාබද්ධකරණය LKAS 27 ප්‍රකාර ඉටුකරනු ලබයි. ප්‍රධාන ඒකාබද්ධ කරන සටහන් පහත සඳහන් පරිදි වේ:

(අ) පොදු පාලන සංයෝජනයට පෙර හෝ පසු සිදුවුව ද සංයෝජනය වන අස්තිත්වයන් හෝ ව්‍යාපාරයන් අතර ගණුදෙනු සියල්ලෙහි ප්‍රතිඵලය ඉවත් කිරීමත් ; සහ

(ආ) සංයෝජිත අස්තිත්වය එක් මුල්‍ය ප්‍රකාශන කට්ටලයක් ඉදිරිපත් කරන හෙයින් ඒකාකාර ගිණුම් ප්‍රතිපත්ති කට්ටලයක් තෝරා ගැනීමේ ප්‍රතිඵලයන් ලෙස, සංයෝජනය වන අස්තිත්ව හෝ ව්‍යාපාරයන්හි වත්කම්, වගකීම් සහ ස්කන්ධය ගැලපීමට සිදුවිය හැකිය.

**අළුතින් පිහිට වූ / ස්ථාපනය කළ පරිපාලක සමාගමක් මගින් ආවරණය කරන ගිණුම් කාලපරිච්ඡේදය**

13. ස්වකීය කොටස් නිකුතුව සඳහා හුවමාරුවක් ලෙස සංයෝජන වන අස්තිත්තවල හෝ ව්‍යාපාරවල නිකුත් කළ කොටස් හෝ ස්කන්ධය අත්පත්කර ගන්නා නව පරිපාලනයක් පිහිටුවීම මගින් පොදුපාලන සංයෝජනයක් ඇති කළ හැකිය. එවැනි අවස්ථා වලදී නම් පරිපාලකයේ පළමු ගිණුම් කාලපරිච්ඡේදය නිරන්තරයෙන් සමූහය සඳහා තෝරගන්නා ලද ශේෂ පත්‍ර දින සිට අවසන් වන වර්ෂයකට වඩා අඩු කාලපරිච්ඡේදයක් වේ. මෙය සාමාන්‍යයෙන් එකක් හෝ ඊට වැඩි ගණනක සංයෝජනය වන අස්තිත්ව හෝ ව්‍යාපාරයන්හි පවතින ශේෂපත්‍ර දිනය වේ.

14. නිරන්තරයෙන් නව පරිපාලනයක් පිහිටු වීමේ දිනය සහ සමාගමේ ආරම්භක හෝ අවසාන ගිණුම් කාලපරිච්ඡේදය සමාන නොවේ. නිශ්චිත වශයෙන්ම පරිපාලක සමාගම ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක් නම්, ඒකාබද්ධ මුල්‍ය ප්‍රකාශනයන් මව් සමාගමේ ගිණුම් කාලපරිච්ඡේදය ආවරණය කළ යුතු බව සමාගම් පනතේ අවශ්‍යතාවයයි. මෙම අවශ්‍යතාවය සංසන්දනාත්මක තොරතුරු හෙළිදරව් කිරීම වලක්වන බවට තර්ක ඉදිරිපත් කළ හැකිය. එසේ වුවත් හරය වශයෙන් සංයෝජනය වන අස්තිත්ව හෝ ව්‍යාපාර නව නෛතික පරිපාලනයක් යටතේ පෙර පරිදි අඛණ්ඩව වෙළඳාමෙහි යෙදෙන විට ඉදිරිපත් කරන්නා වූ වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදය පුරාම එකී නෛතික පරිපාලනයන් පැවතුනා සේ සලකා ඒකාබද්ධ මුල්‍ය ප්‍රකාශ පිළියෙල කළ පදනම පැහැදිලි ලෙස දක්වෙන කැපී පෙනෙන පාද සටහනක්ද සහිතව එකාබද්ධ මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම යෝග්‍ය වන්නේය.

**ව්‍යවහාර කළ යුතු SLFRSs/ LKASs වලින් අවශ්‍යකරන දැට අමතර හෙළිදරව් කිරීම්**

15. ඒකාබද්ධ ගිණුම්කරන මූලධර්ම භාවිතා කරමින් පොදු පාලන සංයෝජනයක් සඳහා ව්‍යවහාර කළ ගිණුම් තැබීමේදී යොදාගත් ගිණුම් ප්‍රතිපත්තීන් හෙළිදරව් කිරීම අස්තිත්වයන් කළ යුතුය. ගිණුම් ප්‍රතිපත්තියේ විස්තරවලට සම්බන්ධ ගිණුම්කරණය යටතේ නිශ්චිත මූලධර්ම සහ යොදාගත් පදනම් පිළිබඳ සාකච්ඡාවක් ඇතුළත් විය යුතු අතර, එහෙත් ඒවාට පමණක් සීමා විය යුතු නැත.

16. සත්‍යවූත් සාධාරණවූත් අදහසක් පෙන්වීමේ අවශ්‍යතාව සිහියේ තබාගනිමින්, මෙම SoRP ව්‍යවහාර කරන අස්තිත්ව ඔවුන්ගේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයන්හි පොදු පාලන සංයෝජනයන්හි වැදගත් විස්තර හෙළිදරව් කළ යුතු ය.

17. ඒකාබද්ධ ගිණුම්කරණය භාවිතා කරමින් ගිණුම් තබන ලද සෑම පොදු පාලන සංයෝජන සඳහා පහත තොරතුරු හෙළිදරව් කළ යුතු ය ඃ

(අ) සංයෝජනය වන අස්තිත්වයන්ගේ නම් ; (වාර්තාකරණ අස්තිත්වය හැර)

(ආ) පොදු පාලන සංයෝජනයේ දිනය ;

(ඇ) නිකුත් කරන ලද කොටස් හැර ප්‍රතිශ්ඨාවෙහි සංයුතිය සහ ප්‍රතිශ්ඨාවෙහි සාධාරණ අගය ;

(ඈ) ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සංගතතාවය මුදුන්පත් කර ගැනීමට යම් අස්තිත්වයක් හෝ ව්‍යාපාරවල ශුද්ධ වත්කම් සහ ශුද්ධ ලාභයට හෝ අලාභයට සිදුකරන ලද සැලකිය යුතු අන්දමේ ගැලපිළිවල ස්වභාවය සහ පොදු පාලන සංයෝජනයේ ප්‍රතිඵලයක් වශයෙන් යම් අස්තිත්වයක හෝ ව්‍යාපාරයක ශුද්ධ වත්කම්, ශුද්ධ ලාභය හෝ අලාභයට කරන ලද වෙනත් යම් සැලකිය යුතු අන්දමේ ගැලපුම් පිළිබඳ පැහැදිලි කිරීමක් ;

(ඉ) ඒකාබද්ධ සංචිතයට කළ ගැලපීම් පිළිබඳ ප්‍රකාශනයක්.

**කොටසක ඉපැයීම්**

18. සංයෝජිත අස්තිත්වය සෑම විටම පැවතියේ යයි සලකා සංයෝජිත අස්තිත්වයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන නිසා සම්බන්ධන ගිණුම්කරණය භාවිතා කර ගිණුම් ගත කර පොදු පාලන සංයෝජනයක කොටසක් ලෙස නිකුත් කළ සාමාන්‍ය කොටස් ඉදිරිපත් කර ඇති සියලු කාලපරිච්ඡේද සඳහා කොටස්හිමියන්ට හිමි, සාමාන්‍ය කොටස් සංඛ්‍යාව ඇතුළත් කරයි. එම නිසා ඒකාබද්ධ ගිණුම්කරණය භාවිතාකරමින් ගිණුම් තබන ලද පොදු පාලන සංයෝජනයක කොටසක මූලික ඉපැයීම් ගණනය කිරීම සඳහා භාවිතා කළයුතු සාමාන්‍ය කොටස් සංඛ්‍යාව වනුයේ සංයෝජනයෙන් පසු ඉතිරිව ඇති අස්තිත්වයේ කොටස්හිමියන්ට හිමි කොටස් හි සාමාන්‍යය වේ.

**බලපවත්වන දිනය**

19. මෙම නිර්දේශිත පරිචය ප්‍රකාශනය 2013 ජනවාරි 01 වැනි දිනට පසුව හෝ එම දිනෙන් ආරම්භ වන මූල්‍ය කාලපරිච්ඡේද සඳහා බලපැවැත්වේ.

**1 වැනි පරිශිෂ්ඨය**

**සංඛ්‍යාත්මක උදාහරණ**

මෙම පරිශිෂ්ඨය SoRP හි කොටසක් නොවන අතර පහදාදීමේ අරමුණ සඳහා පමණක් අන්තර්ගත කරනු ලැබේ. උදාහරණ සියලුම විය හැකි සිදුවීම් පෙල ආවරනය අපේක්ෂා නොකෙරේ,

***පසුතල තොරතුරු*** ඃ

P අස්තිත්වයට පරිපාලිත සමාගම් ගණනාවක් ඇත. මෙම උදාහරණය X අස්තිත්වය, Y අස්තිත්වය සහ A අස්තිත්වය යන පරිපාලිත සමාගම් තුන සලකා බලයි.


වර්ෂ ගණනාවකට පෙර P අස්තිත්වය X අස්තිත්වයේ 100% රු. 18,000 ට අත්පත්කර ගෙන ඇත. එම අවස්ථාවේ දී P අස්තිත්වය කීර්තිනාමය රු. 3,000 ක් සහ අත්පත් කරගත් හඳුනාගත හැකි වත්කම්වල සාධාරණ අගය රු. 15,000 ක් ලෙස වාර්තා කර තිබුණි. (මෙය එවකට අත්පත්කරගත් වත්කම්වල ධාරණ අගයට සමාන වේ.)

වර්ෂ ගණනාවකට පෙර P අස්තිත්වය සමූහයෙන් පිටත පාර්ශවයක් වන S කොටස් හිමියා සමග Y අස්තිත්වය පිහිටුවා ඇත. Y අස්තිත්වයේ P ගේ ආයෝජන පිරිවැය රු. 15,000, ක් වූ අතර, එය Y අස්තිත්වයේ කොටස් ප්‍රාග්ධනයෙන් 75%කි.

20 X 0, ජනවාරි 01 වැනි දින P අස්තිත්වය රු. 10,000 ක කොටස් ප්‍රාග්ධනයක් යොදමින් නව අස්තිත්වයක් වන A අස්තිත්වය පිහිටුවයි.

20X1 දෙසැම්බර් 31 වැනි දින A අස්තිත්වය P අස්තිත්වයෙන් සහ S කොටස් හිමියාගෙන් X අස්තිත්වයේ සහ Y අස්තිත්වයේ 100% ක් කොටස් හිමිකම අත්පත් කරගන්නා ලදී. මේ වෙනුවට පිළිවෙලින් P අස්තිත්වය සහ S කොටස් හිමියා වෙත එකක් රු. 1 ක් වු සම මිලට වූ සාමාන්‍ය කොටස් 7,000 ක් සහ 3,000 ක් නිකුත් කරන ලදී. A අස්තිත්වයේ, X අස්තිත්වයේ සහ Y අස්තිත්වයේ මුදල් වර්ෂය දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වේ.

20X1 දෙසැම්බර් 31 වැනි දිනට Y අස්තිත්වයේ වත්කම් සහ වගකීම්වල සාධාරණ අගය ඒවායේ ධාරන වටිනාකමට සමාන වේ. ව්‍යාපාර සංයෝජනය තුළින් පැනනගින කිසියම් බදු බලපෑමක් නොසලකා හරින්න.




**A අස්තිත්වය, X අස්තිත්වය සහ Y අස්තිත්වයේ 20X1 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශන.**

| | *A අස්තිත්වය* *රු.* | *X අස්තිත්වය* *රු.* | *Y අස්තිත්වය* *රු.* |
|---|---|---|---|
| අයභාරය | 2,000 | 40,000 | 50,000 |
| ලාභය හෝ අලාභය | (4,000) | 20,000 | 20,000 |

**A අස්තිත්වය, X අස්තිත්වය සහ Y අස්තිත්වයේ 20X1 දෙසැම්බර් 31 වැනි දිනට ශේෂ පත්‍රයන් වන්නේ :**

| | *A අස්තිත්වය (කොටස් නිකුත් කිරීමට පෙර)* | *A අස්තිත්වය (කොටස් නිකුත් කිරීමට පසු)* | *X අස්තිත්වය* | *Y අස්තිත්වය* |
|---|---|---|---|---|
| | *රු.* | *රු.* | *රු.* | *රු.* |
| පරිපාලිත සමාගම්හි ආයෝජන | - | 2,23,000 | - | - |
| අනෙකුත් වත්කම් | 5,000 | 5,000 | 100,000 | 120,000 |
| ශුද්ධ වත්කම් | 5,000 | 228,000 | 100,000 | 120,000 |
| ප්‍රාග්ධනය (කොටස් අධි මිල ඇතුළත්ව) | 10,000 | 223,000 | 10,000 | 20,000 |
| සමුච්චිත ලාභය (අලාභය) | (5,000) | (5,000) | 90,000 | 100,000 |
| | 5,000 | 228,000 | 100,000 | 120,000 |

ප්‍රතිෂ්ඨාව ලෙස A අස්තිත්වය විසින් නිකුත් කල නව කොටස් 10,000 X අස්තිත්වය සහ Y අස්තිත්වය අත්පත් කර ගැනීමේ සැලකෙන පිරිවැයට සමාන අගයක් වාර්තා කරයි (රු. 223,000). 20X1 දෙසැම්බර් 31 දිනට පොත්වල පවතින X අස්තිත්වයේ ශුද්ධ වත්කම්හි වටිනාකම (රු. 100,000) P අස්තිත්වය විසින් X අස්තිත්වය අත්පත්කර ගැනීමේදී පැන නගින පවතින කීර්තිනාමය (රු. 3,000) එකතු කළ විට X අස්තිත්වය අත්පත්කරගැනීමේ සැලකන පිරිවැය රු. 103,000 කි. 20X1 දෙසැම්බර් 31 වැනි දිනට Y අස්තිත්වයේ පොත්වල පවතින ශුද්ධ වත්කම් වටිනාකම වන රු. 120,000 Y අස්තිත්වය අත්පත් කරගැනීමේ සැලකෙන පිරිවැය වේ. මෙම උදාහරණයේ යොදාගෙන ඇති සලකෙන පිරිවැය පහදා දීමේ නිදර්ශණාත්මක අරමුණ සඳහා පමණක් සහ පාලිත සමාගම් අත්පත් කර ගැනීමේ පිරිවැය ලෙස A අස්තිත්වයේ තනි මූල්‍ය ප්‍රකාශනයන්හි වාර්තා කිරීමේ වටිනාකම අත්‍යාවශ්‍යයෙන් නියෝජනය නොවේ.

**20X0 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා A අස්තිත්වය, X අස්තිත්වය සහ Y අස්තිත්වයේ ආදායම් ප්‍රකාශනයන් වන්නේ,**

| | *A අස්තිත්වය* <br> *රු.* | *X අස්තිත්වය* <br> *රු.* | *Y අස්තිත්වය* <br> *රු.* |
|---|---|---|---|
| අයභාරය | 1,000 | 38,000 | 45,000 |
| ලාභය හෝ අලාභය | (2,000) | 15,000 | 12,000 |

**20X0 දෙසැම්බර් 31 දිනට A අස්තිත්වය X අස්තිත්වය සහ Y අස්තිත්වය ශේෂ පත්‍ර වන්නේ.**

| | *A* <br> *අස්තිත්වය* <br> *රු.* | *X* <br> *අස්තිත්වය* <br> *රු.* | *Y* <br> *අස්තිත්වය* <br> *රු.* |
|---|---|---|---|
| ශුද්ධ වත්කම් | 9,000 | 80,000 | 100,000 |
| ප්‍රාග්ධනය (කොටස් අධි මිල ඇතුලත්ව) | 10,000 | 10,000 | 20,000 |
| සමුච්චිත ලාභය /(අලාභය) | (1,000) | 70,000 | 80,000 |
| | 9,000 | 80,000 | 100,000 |

**විශ්ලේෂණයන්**

A අස්තිත්වය X අස්තිත්වය සහ Y අස්තිත්වය ව්‍යාපාර සංයෝජනයට පෙර හා පසු P අස්තිත්වයේ පොදු පාලනය යටතට ගැනෙන හෙයින් ව්‍යාපාර සංයෝජනය නිශ්චිත ලෙසම SLFRS 3 විෂය පථයෙන් බැහැර වේ.

A අස්තිත්වයේ අධ්‍යක්‍ෂවරුන් X අස්තිත්වයේ සහ Y අස්තිත්වයේ කොටස් හිමිකම අත්පත්කර ගැනීම සඳහා ගිණුම් තැබීමට ඒකාබද්ධ ගිණුම්කරණ මූලධර්ම යොදාගැනීම තෝරා ගනී.

ඒකාබද්ධ ගිණුම්කරණ මූලධර්ම යටතේ දී X අස්තිත්වයේ සහ Y අස්තිත්වයේ වත්කම් සහ වගකීම් A අස්තිත්වයේ මූල්‍ය ප්‍රකාශනයන්හි ඒකාබද්ධ කරනුයේ සංයෝජනයට වහාම පෙර P අස්තිත්වයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයන්හි සඳහන්ව පවතින පොත් වටිනාකම් යොදාගෙනය. P අස්තිත්වය විසින් X අස්තිත්වය මුල් අත්පත්කරගත් අවස්ථාවේ පැන නගින කීර්තිනාමය වාර්තා කිරීමට සහ සංයෝජනයට වහාම පෙර P අස්තිත්වයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වල සඳහන්ව පැවති Y අස්තිත්වයේ සුළු කොටස්හිමියන්ගේ අයිතිය වාර්තාකිරීමට මෙම ක්‍රියාපටිපාටිය අවශ්‍ය වේ.

මෙම සංයෝජනය වන වේලාවේදී පිරිවැයට වැඩි අත්පත් කර ගැනීමට භාජනය වන්නාගේ හඳුනාගත හැකි වත්කම්, වගකීම් සහ අසම්භාව්‍ය වගකීම්වල ශුද්ධ සාධාරන අගයට අත්පත් කරගන්නාගේ අයිතියේ අතිරික්තයක් හෝ යම් අතිරේක කීර්තිනාමයක් හඳුනාගැනීම සිදු නොවේ.

A අස්තිත්වයේ 20X1 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ ආදායම් ප්‍රකාශනය වනුයේ :

| | *A අස්තිත්වය* රු. | *X අස්තිත්වය* රු. | *Yඅස්තිත්වය* රු. | *ගැලපීම්* රු. ගැ | *ඒකාබද්ධ* රු. |
|---|---|---|---|---|---|
| අයභාරය | 2,000 | 40,000 | 50,000 | - | 92,000 |
| ලාභය හෝ (අලාභය) | (4000) | 20,000 | 20,000 | | 36,000 |
| Y අස්තිත්වයේ කළින් සුළු කොටස් හිමියන්ට අපේක්ෂිත | | | | 5,000 (Y1) | (5,000) |
| A අස්තිත්වයේ ස්කන්ධ හිමියන්ට දරන්නන්ට ආරෝපිත | | | | | 31,000 |

**ගැලපීම**

(Y1) සංයෝජනයට පෙර Y අස්තිත්වයේ සුළු කොටස් හිමියන්ට ආරෝපිත ලාභය දැක්වීමට ගැලපීමක් :

20X1 දෙසැම්බර් 31 දිනට A අස්තිත්වයේ සම්බන්ධන ශේෂපත්‍රය :

| | *A අස්තිත්වය* රු. | *X අස්තිත්වය* රු. | *Y අස්තිත්වය* රු. | *ගැලපීම්* රු. | *ඒකාබද්ධ* රු. |
|---|---|---|---|---|---|
| කීර්තිනාමය | | | | 3,000 (X1) | 3,000 |
| X අස්තිත්වයේ හා Y අස්තිත්වයේ ආයෝජන | 223,000 | - | - | (103,000)(X3)<br>(120,000)(Y5) | - |
| වෙනත් වත්කම් | 5,000 | 100,000 | 120,000 | | 225,000 |
| ශුද්ධ වත්කම් | 228,000 | 100,000 | 120,000 | | 228,000 |
| (කොටස් අධි මිල ඇතුලත්ව) | 23,3000 | 10000 | 20000 | 10,000(X3)<br>(20,000)(Y5) | 23,300 |
| අනෙකුත් සංචිත | - | - | - | (85,000)(X3)<br>(75,000)(Y5) | (160,000) |
| සමුච්චිත ලාභ (අලාභ) | (5,000) | 90,000 | 100,000 | (5,000)(X2)<br>(25,000)(Y4) | 155,000 |
| | 228,000 | 100,000 | 120,000 | | 228,000 |

**ගැලපීම්**

X අස්තිත්වයට අදාලව

(X1) P අස්තිත්වය විසින් X අස්තිත්වය පළමුවෙන් අත්පත් කර ගැනීම මත පැනනගින කීර්තිනාමය P අස්තිත්වයේ ඒකාබද්ධ මුල්‍ය ප්‍රකාශනයන්හි සංයෝජනයට වහාම පෙර සඳහන් ආකාරයට ගැලපීම (රු.3000)

(X2) P අස්තිත්වය විසින් X අස්තිත්වය මුලින් අත්පත්කරගැනීමට පෙර X අස්තිත්වය ජනිත වූ සමුච්චිත ලාභය ඉවත් කිරීමට ගැලපීම (රු. 5,000)

(X3) A අස්තිත්වයේ ආයෝජන පිරිවැයට සම්බන්ධ X අස්තිත්වයේ කොටස් ප්‍රාග්ධනය ඉවත් කිරීම ගැලපීම. A අස්තිත්වයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයන්හි වෙනම වූ රු. 85,000 ක සංචිතයක් ඇති කිරීම ගැලපීම.

Y අස්තිත්වයට අදාලව

(Y4) සංයෝජනයට පෙර Y අස්තිත්වයේ සුළු කොටස්හිමියන්ට අදාල ලාභය පිළිබිඹු වීමට ගැලපීම්.

(Y5) A අස්තිත්වයේ සම්බන්ධිත ආයෝජන පිරිවැයට එරෙහිව Y අස්තිත්වයේ ස්කන්ධයෙහි කොටස් ප්‍රාග්ධනය ඉවත් කිරීමට ගැලපීම. A අස්තිත්වයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශණයන්හි රු. 75,000 ක වෙනම වූ සංචිතයක් ඇති කිරීමට ගැලපුමක් කර ඇත.

**20X0 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා A අස්තිත්වයේ ඒකාබද්ධ ආදායම් ප්‍රකාශනය**

| | *A අස්තිත්වය රු.* | *X අස්තිත්වය රු.* | *Y අස්තිත්වය රු.* | *ගැලපීම් රු. ගැලපීම* | *ඒකාබද්ධ රු.* |
|---|---|---|---|---|---|
| අයභාරය | 1,000 | 38,000 | 45,000 | | 84,000 |
| ලාභය හෝ /අලාභය | (2,000) | 15,000 | 12,000 | | 25,000 |
| සුලු කොටස් | | | | | |
| හිමියන්ට ආරෝපිත | | | | 3,000 (Y1) | (3,000) |
| A අස්තිත්වයේ ස්කන්ධය දරන්නන්ට ආරෝපිත | | | | | 22,000 |

**ගැලපීම්**

(Y1) Y අස්තිත්වයේ සුලු කොටස් හිමියන්ට ආරෝපිත ලාභය දැක්වීමට ගැලපීම.

**20X0 දෙසැම්බර් 31 වැනි දිනට A අස්තිත්වයේ ඒකාබද්ධ ශේෂ පත්‍රය**

| | *A අස්තිත්වය රු.* | *X අස්තිත්වය රු.* | *Y අස්තිත්වය රු.* | *ගැලපීම් රු. ගැලපීම* | *ඒකාබද්ධ රු.* |
|---|---|---|---|---|---|
| කීර්තිනාමය | | | | 3,000 (X2) | 3,000 |
| ආයෝජන | - | - | - | 193,000 (1) | - |
| X අස්තිත්වයේ සහ Y අස්තිත්වයෙහි | - | - | - | (103,000) (X4) | |
| | | | | (90,000) (Y5) | - |
| වෙනත් වත්කම් | 9000 | 80,000 | 100,000 | | 189,000 |
| ශුද්ධ වත්කම් | 9,000 | 80,000 | 100,000 | | 192,000 |

| | A අස්තිත්වය රු. | X අස්තිත්වය රු. | Y අස්තිත්වය රු. | ගැලපීම් රු. ගැලපීම | ඒකාබද්ධ රු. |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධනය (කොටස් අධි මිල ඇතුලත්ව) | 10,000 | 10,000 | 20,000 | 193,000 (1)<br>(10,000) (X4)<br>(20,000) (X5) | 203,000 |
| අනෙකුත් සංචිත | | | | (85,000) (X4)<br>(75,000) (X5) | 160,000 |
| සුලු කොටස් හිමිකම | - | - | - | 25,000 (Y5) | 25,000 |
| සමුච්චිත ලාභය (අලාභය) | (1,000) | 70,000 | 80,000 | (5,000) (X3)<br>(20,000) (Y5) | 124,000 |
| | 9,000 | 80,000 | 100,000 | | 192,000 |

*සටහන* : අස්තිත්වයන්හි කලින් ශේෂ පත්‍ර දිනට සංයෝජිතව තිබුනේයයි සලකා සංසන්දනාත්මක සංඛ්‍යා ප්‍රති ප්‍රකාශ කරයි. ඒකාබද්ධ කොටස ප්‍රාග්ධනයෙන් නියෝජනය වන්නේ ව්‍යාපාර සංයෝජනය කිරීමේ අරමුණ සඳහා නිකුත් කල ප්‍රාග්ධනයට ගැලපුම් කල A අස්තිත්වයේ කොටස් ප්‍රාධ්ධිතයයි.

**ගැලපීම්**

(1) ව්‍යාපාර සංයෝජනය කිරීමේ අරමුණු සඳහා නිකුත් කල ප්‍රාග්ධනය පසු පසට තල්ලු කිරීම සඳහා ගැලපීම (රු. 193,000 න් X අස්තිත්වයට අදාල රු. 103,000 සහ Y අස්තිත්වයට අදාල රු. 90,000 වෙනුවෙනි)

ඒකාබද්ධ ගිණුම්කරණයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයන්ගේ අරමුණු වන්නේ ඒවා නිතරම සංයෝජිතව පැවතියේ නම් සංයෝජනය වන අස්තිත්වයන්ගේ ප්‍රතිඵල හා මූල්‍ය තත්ත්වය පෙන්වීම වේ. ඒ නිසාවෙන් ව්‍යාපාර සංයෝජනයේ අරමුණු සඳහා නිකුත් කර ඇති කොටස 7000 කොටස් ප්‍රාග්ධනය පිළිබඳව ඒවා සම සමව නිකුත් කර තිබුණේ යයි සලකා පෙන්විය යුතුය.

**X අස්තිත්වය සම්බන්ධයෙන්**

(X2) P අස්තිත්වය විසින් X අස්තිත්වය පළමුවෙන් අත්පත් කර ගැනීම මත පැන නගින කීර්තිනාමය P අස්තිත්වයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයන්හි සංයෝජනයට වහාම පෙර සඳහන් ආකාරයට ගැලපීම. (රු. 3,000).

(X3) P අස්තිත්වය විසින් X අස්තිත්වය මුලින් අත්පත් කර ගැනීමට පෙර X අස්තිත්වයේ ජනිත වූ සමුච්ජිත ලාභය ඉවත් කිරීමට ගැලපීම. (රු. 5,000).

(X4) A අස්තිත්වයේ ඒකාබද්ධ ආයෝජන පිරිවැයට සම්බන්ධ X අස්තිත්වයේ කොටස් ප්‍රාග්ධනය ඉවත් කිරීම ගැලපීම. A අස්තිත්වයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයන්හි වෙනම වූ රු. 85,000 ක සංචිතයක් ඇති කිරීම ගැලපීම.

**Y අස්තිත්වය සම්බන්ධයෙන් :**

(Y5) A අස්තිත්වයේ සම්බන්ධිත ආයෝජන පිරිවැයට එරෙහිව Y අස්තිත්වයේ ස්කන්ධමය කොටස් ප්‍රාග්ධනය ඉවත් කිරීමට ගැලපීමයි. ව්‍යාපාර සංයෝජනයට පෙර P අස්තිත්වයට පැවතියේ Y අස්තිත්වයේ ස්කන්ධ හිමිකමෙන් 75%ක් පමණි. 20X0 දෙසැම්බර් 31 ක දිනට සුළු කොටස් හිමිකම රු. 25,000 ක් වාර්තා විය.

A අස්තිත්වයෙහි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයන්හි වෙනම වූ සංචිතයකට රු. 75,000 ක ගැලපීමක් කර ඇත.

**කොටසක ඉපැයීම්**

ඉහත උදාහරණයේ වෙනස නොවූ කරුණු පදනම මත A අස්තිත්වයේ ඉදිරිපත් කර ඇති සෑම කාල පරිච්ඡේදයකට ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල කොටසක ඉපැයීම ගණනය කර ඇත්තේ ඒකාබද්ධ ලාභය (සුළු කොටස්හිමියාට ආරෝපිත ලාභ හැර) මත සහ කොටස් 20000 මතය.

(X අස්තිත්වය සහ Y අස්තිත්වය ස්කන්ධය හිමිකමින් ප්‍රතිශ්ඨාව සඳහා 20X1 දෙසැම්බර් 31 න් අවසන් දෙවර්ෂය පුරා A අස්තිත්වය නිකුත් කල ස්කන්ධ කොටස් 10000 සහ 20X1 දෙසැම්බර් 31 දින අවසන් වර්ෂයට A අස්තිත්වය නිකුත් කළ කොටස් 10000 ක් සමන්විතව).

**2 වැනි පරිශිෂ්ඨය**

මෙම SoRP ව්‍යවහාර කළ හැකි අවස්ථා වලට උදාහරණ පහත දක්වේ.

(අ) අස්තිත්වයක් අලුතින් පිහිටුවාගත්, අස්තිත්වයක් සංස්ථාපිත කිරීම සහ අලුතින් සංස්ථාපිත අස්තිත්වය එහි ව්‍යාපාර සමහරක් හෝ සියල්ලම මාරු කිරීම.

(ආ) මව් සමාගමක් සම්පූර්ණ වශයෙන් හිමි පාලිත සමාගමකට ව්‍යාපාරය මාරු කිරීම සහ පාලිත සමාගම ඇවර කිරීම. මෙම ගණුදෙනුව නෛතික සංවිධානයෙහි වෙනස් වීමක් මිස වාර්තාකරන අස්තිත්වයක වෙනස්වීමක් නොවේ.

(ඇ) පරිපාලකයක් අර්ධව හිමි පරිපාලිත ගණනාවක එහි හිමිකම සම්පූර්ණයෙන් හිමි නව පරිපාලිතයකට මාරු කිරීම. මෙය ද නෛතික සංවිධානයෙහි වෙනස්වීමක් මිස වාර්තාකරන අස්තිත්වයේ වෙනස්වීමක් නොවේ.

(ඈ) පරිපාලකයන් එහි හිමිකම් අයිතිය හෝ එයට සම්පූර්ණයෙන් අයත් පරිපාලිතයක, ව්‍යාපාරය පරිපාලනය අර්ධ වශයෙන් හිමි පරිපාලිතයක් නිකුත් කරන අතිරේක කොටස් සඳහා හුවමාරු කර ගැනීම එමගින් අර්ධ වශයෙන් හිමි පරිපාලිතය පරිපාලනයේ, පරිපාලකගේ හිමිකම් ප්‍රතිශතය වැඩිකරන අතර, එහෙත් පවතින සුලු කොටස්හිමියන්ගේ අයිතියේ සියලු හිඟ හිටිදෑ අත්හැරීම.

01-183